සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
චක්‍රලේඛ ලිපි අංක:- 31/ 2026

මගේ අංකය:- PPSC/ES/14/FI/06/3-2
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
සබරගමුව පළාත් සභා සංකීර්ණය
නව නගරය - රත්නපුර
2026.08. 05

1. ප්‍රධාන ලේකම්, සබරගමුව පළාත් සභාව
2. ලේකම්, සමාජ සුභසාධන,පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන සහ ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය, සබරගමුව පළාත් සභාව
3. අධ්‍යක්ෂ, ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව, සබරගමුව පළාත් සභාව

**<u>සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයෙහි II වන ශ්‍රේණියේ ග්‍රාම සංවර්ධන නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026</u>**

සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු **II වන ශ්‍රේණියේ ග්‍රාම සංවර්ධන නිලධාරීන්** වෙතින් උක්ත විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම චක්‍රලේඛ ලිපිය සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ II වන ශ්‍රේණියේ ග්‍රාම සංවර්ධන නිලධාරීන්ගේ **දැනගැනීම සඳහා වහාම යොමු කරන්න.** ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර සිටින නිලධාරීන්ගේ දැනගැනීම සඳහා ද මෙය යැවිය යුතු වේ. අයදුම්කරුවන් ඉදිරිපත්ව නොමැති නම් විභාගයේ ඉදිරි කටයුතු කිරීමට ප්‍රථමයෙන් ඒ පිළිබඳව ද කඩිනමින් මා දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වමි. **මෙම චක්‍රලේඛය හා අයදුම්පත්‍රය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියෙහි** www.psc.sg.gov.lk **සහ සබරගමුව පළාත් වෙබ් අඩවියෙහි** www.sg.gov.lk පළ කර ඇත.

02. අදාළ බඳවා ගැනීමේ පරිපාටියට අනුව මෙම විභාගයේ විෂයය නිර්දේශය පහත සඳහන් පරිදි වේ.

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| ග්‍රාම සංවර්ධන විෂයානුබද්ධ දැනුම | මූලික ආර්ථික සංකල්ප හා න්‍යාය, ජාතික ආදායම, ශ්‍රීලංකාවේ වර්තමාන ආර්ථික ප්‍රශ්න, සමාජ ස්ථරායනය හා විභේදනය, සමාජ ප්‍රතිපත්ති සකස් කිරීමේ මූලාශ්‍ර | පැය 03 | 100 | 40 |

03. **විභාගයට අයදුම් කිරීම -** අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු ය. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙළ කර ගත යුතු අතර, ඒ අනුව පිළියෙළ කරන ලද අයදුම්පත්‍ර අපේක්ෂකයින් විසින් සිය පෞද්ගලික ලිපිගොනුව නඩත්තු කරන කාර්යාලයේ / දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් **2026.09.07** දින හෝ ඊට පෙර මෙම කාර්යාලය වෙත ලැබෙන සේ යොමු කළ යුතු ය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදාළ තොරතුරු සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. මින් පෙර II වන ශ්‍රේණියේ ග්‍රාම සංවර්ධන නිලධාරීන්ගේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිට එම අවස්ථාවේ විභාගය අසමත් වී නැවත අයදුම් කරන්නේ නම් සමස්ත විභාගය සඳහා රු. **600/-** ක විභාග ගාස්තුවක් ගෙවිය යුතු වේ. එම විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ **20.03.02.99** දරන ආදායම් ශීර්ෂයට බැර වන ලෙස සබරගමුව පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට / දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන ආයතන හැර) හෝ සබරගමුව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවිය හැකිය. එම මුදල් ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ පිටුපස නොගැලවෙන සේ ඇලවිය යුතු ය.

05. විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ට විභාගය පවත්වන දිනය, ස්ථානය හා වේලාව විභාග ප්‍රවේශ පත්‍ර මගින් යථා කාලයේ දී දැනුම් දෙනු ලැබේ.

06. මෙම විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කරුණක් පිළිබඳව සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

එස්.පී.කේ.බෝධිමාන්න
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

එස්.පී.කේ. බෝධිමාන්න
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

*<u>ආදර්ශ අයදුම්පත්‍රය</u>*

|  |
|---|
|  |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**<u>සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ II ශ්‍රේණියේ ග්‍රාම සංවර්ධන නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026</u>**

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
සිංහල - 1
දෙමළ - 2 ☐
(කොටුව තුළ අදාළ අංකය ලියන්න )

01. (a) මුල’කුරු සමඟ නම : ......................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : SILVA, A.B.

(b) සම්පූර්ණ නම (සිංහලෙන් / දෙමළෙන්) : ..........................................................
..................................................................................................................

(c) මුල’කුරු සමඟ නම (සිංහලෙන් / දෙමළෙන්) : ......................................................
..................................................................................................................

(d) ස්ත්‍රී / පුරුෂ භාවය : ..............................................................................

(e) ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

(f) දුරකථන අංකය : රාජකාරී ..............................................................................
පෞද්ගලික ..........................................................................

02. සේවය කරන කාර්යාලයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ නම :.......................................................
..................................................................................................................

03. රාජකාරී ලිපිනය: ...........................................................................................
..................................................................................................................
(ප්‍රවේශපත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)

4. ග්‍රාම සංවර්ධන නිලධාරි II ශ්‍රේණියට උසස් වූ දිනය:-.........................................................

5. පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වූ දිනය-.....................................................

06. ඔබ විභාගයට ඉල්ලුම් කරන්නේ ප්‍රථම වතාවටද : ඔව්/ නැත.

07. එසේ නොවන්නේ නම්, විභාග ගාස්තු ගෙවා ලබාගත් (අමුණා ඇති) මුදල් භාරගැනීමේ කුවිතාන්සියේ,

අංකය................................ මුදල ..................................

දිනය.................................. විභාග ගාස්තු ගෙවූ.
කාර්යාලය ..........................................................

මුදල් භාරගැනීමේ කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න
*(කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)*

08. අයදුම්කරුගේ සහතිකය :

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට යටත් වන බව ද ප්‍රකාශ කරමි.

දිනය:- .........................................................
(අපේක්ෂකයාගේ/ අපේක්ෂිකාවගේ අත්සන)

09. දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ නිර්දේශය :

ඉහත නම සඳහන් අපේක්ෂකයා ඉදිරිපත් කර ඇති තොරතුරු පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බව/ නිවැරදි නොවන බව සහතික කරමි.(නිවැරදි නොවන්නේ නම් හේතු දක්වන්න.)
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

.............................................

දිනය :- දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ
අත්සන හා පදවි නාමය
(කරුණාකර නිල මුද්‍රාව තබන්න.)